


# ජපාන මාර්ග සංඥා සහ රථවාහන මාර්ග සලකුණු අනුගමනය කරමු (1)

| | |
|---|---|
|  | පදිකයින් මෙන්ම රථ වාහනද නතර කළ යුතු වේ. දකුණට හෝ වමට හැරවීමක් කල නොහැක. |
|  | ආලෝක සංඥාව රතු පැහැයෙන් දිස්වුවද, ඊතලය දැලවීම සිදු විටක, දක්වා ඇති දිශාවට ධාවනය කල හැකිය. |
|  | රථ වාහන ධාවනයට අවසර නැත. * මෙයට පාපැදිද ඇතුළත් වේ. |
|  | යතුරුපැදි හැර වෙනත් මෝටර් රථ ගමන් කල නොහැක. |
|  | අධි භාර ගැල් භාණ්ඩ ට්‍රක් රථ වැනි බර වාහන ගමන් කල නොහැක. |
|  | මෙම මාර්ගය මෝටර් රථ ධාවනය සඳහා පමණි. පදිකයින්, පාපැදි සහ යතුරු පාපැදි ධාවනය කල නොහැක. |
|  | මෙම මාර්ගය පදිකයින් සහ පාපැදි සඳහා පමණක් වේ. වෙනත් රථ වාහන ධාවනයට අවසර නොමැත. |
|  | මෙම මාර්ගය පදිකයින් සඳහා පමණි. රථ වාහන ධාවනය කල නොහැක. |

| | |
|---|---|
|   | මෙම සලකුණ ඇති ස්ථානයන්හිදී මුළුමණින්ම එක් වරක් රථය නතර කල යුතුය. |
|   | මෙම සලකුණ ඇති ස්ථානයන්හී සෙමින් ඉදිරියට ධාවනය කල යුතුවේ. * මාර්ගෝපදේශය පැයට කිලෝමීටර 10ක් හෝ ඊට අඩු වේගයක් දක්වා ඇති විටක, එය වහාම නතර කළ හැකි වේගයක ලෙස වේ. |
|   | දක්වා ඇති වේග සීමා සංඛ්‍යාව ඉක්ම වන ධාවනය කිරීම් නොකල යුතුයි. |
|   | පදික මාරුවීම් ස්ථානයන්හිදී, පදිකයින් මාර්ගය තරණය කිරීමකදී, මුළුමණින්ම රථය නතර කර පදික මාරුවීමට ඉඩ සැලසිය යුතුයි. |

福岡県警察
Fukuoka Prefectural Police

# ජපාන මාර්ග සංඥා සහ රථවාහන මාර්ග සලකුණු අනුගමනය කරමු (2)


| | |
|---|---|
|  | එක් දිසා ධාවන-මාර්ග වීදිවල, ඊතලයෙන් දක්වා ඇති දිශානතියට පමණක් ඉදිරියට යා හැකිය. |
|  | මෙම ලකුණින් දක්වා ඇති දිශාවෙන් ඉදිරියට යා නොහැක. |
|   | U-හැරීම් නොකල යුතුයි. |
|   | ඉදිරියෙන් ධාවනය වන වාහනයක් පසුකර යන විට, කහ ඉර ඉක්මවා දකුණට යෑම නොකල යුතුයි. |
|  | රථ වාහන නැවැත්වීම සහ වරක් නැවතුම්ද කල නොහැක. |
|  | රථ වාහන නැවැත්වීම කල නොහැක. |

| | |
|---|---|
|  | රථ වාහන ඊතලයෙන් දක්වා ඇති දිශාවට පමණක් ඉදිරියට යා හැකිය. |
|   | මංසන්ධිවලදී, තමා ගමන් කරන දිශාව අනුව නම් කරන ලද ධාවන මංතීරුව භාවිතා කළ යුතුය. |
|   | මෙය නම් කරන ලද වාහන සඳහා වෙන් කර ඇති මංතීරුවක් වේ. |
|  | මෙහි ඉදිරියෙන් දුම්රිය හරස් මාර්ගයක් ඇත. |
|  | ආසන්නයේ පාසලක් ඇති අතර එය ළමයින් නිතර භාවිතා කරන මාර්ගයකි. |
|  | මෙහි ආසන්නයේ මංසන්ධියක් ඇත. |

福岡県警察
Fukuoka Prefectural Police

# ජපානයේ නීති රීති අනුගමනය කර ආරක්ෂිතව රිය පදවන්න (1)

## (1) වම් පසින් රිය ධාවනය



★ජපානයේ, වාහන මාර්ගයේ වම් පැත්තේ ධාවනය කරනු ලබයි.
තමා මේ දක්වා, මාර්ගයේ දකුණු පැත්තේ රිය පදවන රටක රිය පදවා ඇති පුද්ගලයෙකු නම්, මංසන්ධියකදී රථය හැර වීම වැනි අවස්ථාවකදී දකුණු පැත්තෙන් රිය පැදවීමට ඉඩ ඇති එබැවින්, කරුණාකර සැළකිලිමත් වන්න.

★ මාර්ගයේ දකුණු පැත්තේ රථය පැදවීම, මාර්ග නීති උල්ලංඝනය කිරීමක් වන අතර අන්තරාදායක අනතුරු වලට හේතු විය හැකිය.

## (2) රථවාහන අනතුරක් සිදු වූ විටක, ඒ පිළිබඳව පොලිසියට වාර්තා කිරීමට වග බලා ගන්න

★ රථවාහන අනතුරක් සිදුවුවහොත්, කිසිවෙකුට තුවාල සිදු නොවුනද, අනිවාර්යෙන් (110) අමතා පොලිසියට වාර්තා කරන්න. යමෙකු තුවාල ලබා සිටියහොත්, ප්‍රථමාධාර ලබා දිය යුතු අතර, (119) අමතා ගිලන් රථයක් ඉල්ලා ඉන්පසු 110 අමතා අනතුර පොලිසියට වාර්තා කරන්න.

★ තුවාල ලැබූ පුද්ගලයින්ට ප්‍රථමාධාර ලබා නොදීමක් හෝ අනතුරක් පොලිසියට වාර්තා නොකිරීමකදී, දැඩි දඬුවම් වලට අමතරව රියදුරු බලපත්‍රය අවලංගු කිරීම වැනි දැඩි පරිපාලන ක්‍රියාමාර්ගවලට භාජනය විය හැකිය.



## (3) බීමත්ව රිය පැදවීම තහනම්ය

★ මත්පැන් පානය කිරීමෙන් පසු, රථ වාහන ධාවනය කිරීම නොකල යුතුයි. දැඩි දණ්ඩන වලට අමතරව, රියදුරු බලපත්‍රය අවලංගු කිරීම වැනි දැඩි පරිපාලන ක්‍රියාමාර්ගවලට භාජනය විය හැකිය.

★ මත්පැන් පානය කර රිය ධාවනය කරන්නේයැයි හැඟෙන කිසිවෙකුට වාහනයක් ලබා නොදෙන්න. එසේම, මත්පැන් පානය කිරීමෙන් පසු රිය පැදවීමට තමා විසින් යම් පුද්ගලයෙකුගෙන් ඉල්ලා සිටීම හෝ ඔහුට ආයාචනා කිරීම නොකළ යුතු අතර, මත්පැන් පානය කර ඇති අයෙකු විසින් පදවන රථයක ගමන් නොකළ යුතුය. මෙම නීති උල්ලංඝනය කිරීම දැඩි දණ්ඩනයන්ට භාජනය වීමට හේතු විය හැක.






මත්පැනින් මත් වූ ලක්ෂණ සහිත නම් රිය ධාවනය නොකරනු!

## (4) දුම්රිය හරස් මාර්ගවල වරක් නැවතීම

★ ජපානය තුල, දුම්රිය හරස් මාර්ගවලදී, අනතුරු ඇඟවීමේ සංඥා නාද නොවන විටදී පවා වරක් නැවතී, දුම්රිය පැමිණීමක් සිදුවේද යන්න නිශ්චය කර හරස් මඟ තරණය කරමු.



## (5) පදිකයින්ට ප්‍රමුඛතාවය

★ ජපානය තුල, පදිකයින්ට සැමවිටම ප්‍රමුඛ වේ. පදික වේදිකාවක හෝ මංසන්ධියක හරස් මාර්ගයක් හරහා යාමට ආසන්න පදිකයෙකු සිටී නම්, වරක් නැවතී ගමන් කිරීමට ඉඩ දෙමු.



## (6) මංසන්ධිවලදී විශේෂිත සැළකිලිමත් වීම

★ මංසන්ධිවලදී, "(1) පදික ප්‍රමුඛතාවය" "(2) දකුණට හැරවීමක් කරන විටක, ඍජු/වමට හැරෙන රථ ප්‍රමුඛතාවය"

★ පදිකයෙකු පදික වේදිකා හරස් මාර්ගයක් හරහා ගමන් කරන්නේ නම් හෝ හරහා යාමට ආසන්න නම්, "වරක් නැවතීම" සිදු කල යුතු වේ.




## (7) ජංගම දුරකථන භාවිතය තහනම්ය



★රථයක් පදවන අතරතුර, හදිසි අවස්ථා වලදී හැර, ජංගම දුරකථනයෙන් කතා බස් කිරීමට හෝ එහි තිරය දෙස බැලීමට යනාදි පිණිස ජංගම දුරකථනයක් භාවිතා නොකරන්න.

## (8) මාර්ග සංඥා වල අර්ථයන් නියමාකාරයෙන් තේරුම් ගැනීම

ජපානය තුල, රථවාහන නීති සහ සංඥා ඔබේ මව් රටේ ඒවාට වඩා වෙනස් වීම් තිබිය හැකිය.




★ ඔබ මෙම ලකුණ දකින විට, ඔබ සම්පූර්ණයෙන්ම වරක් නතර වී වම සහ දකුණ පරීක්ෂා කර ආරක්ෂණය නිශ්චය කරගත යුතු වේ.

**රියදුරු බලපත්‍රවල කල් ඉකුත් වීමේ දිනයක් ඇත. ඔබේ බලපත්‍රය අලුත් කිරීමට වග බලා ගන්න.**

福 岡 県 警 察
Fukuoka Prefectural Police

# ජපානයේ නීති රීති අනුගමනය කර ආරක්ෂිතව රිය පදවන්න (2)

## (9) තමාට රිය පැදවීම පිණිස බලපත්‍ර ලබා දී ඇති වාහන කාණ්ඩ දැන ගනිමු

★තමාට පැදවිය හැකි වාහන කාණ්ඩය තම මව් රටේ බලපත්‍රයට වඩා වෙනස් විය හැකිය.
★රිය පැදවීමට පෙර, තමාට පැදවීමට බලපත්‍ර ලබා දී ඇති වාහන කාණ්ඩය පරීක්ෂා කරන්න.

| | | |
|---|---|---|
| සාමාන්‍ය රථ වාහන | නියමිත මගී ධාරිතාව: මගීන් 10 දෙනෙකු දක්වා<br>දළ වාහන බර: කිලෝග්‍රෑම් 3,500 ට අඩු<br>උපරිම පැටවුම් බර: කිලෝග්‍රෑම් 2,000 ට අඩු | |
| අර්ධ මධ්‍යම ප්‍රමාණයේ රථ වාහන | නියමිත මගී ධාරිතාව: මගීන් 10 දෙනෙකු දක්වා<br>දළ වාහන බර: කිලෝග්‍රෑම් 7,500 ට අඩු<br>උපරිම පැටවුම් බර: කිලෝග්‍රෑම් 4,500 ට අඩු | ★ නියමිත බර පැටවීම සහ මගී ධාරිතාව නිශ්චය කිරීම පිණිස වාහන පරීක්ෂණ සහතිකය පරීක්ෂා කර රිය ධාවනය කරමු. |
| මධ්‍යම ප්‍රමාණ රථ වාහන | නියමිත මගී ධාරිතාව: මගීන් 29 දෙනෙකු දක්වා<br>දළ වාහන බර: කිලෝග්‍රෑම් 11,000 ට අඩු<br>උපරිම පැටවුම් බර: කිලෝග්‍රෑම් 6,500 ට අඩු | |
| බැර වාහන | නියමිත මගී ධාරිතාව: පුද්ගලයින් 30 ක් හෝ ඊට වැඩි<br>දළ වාහන බර: කිලෝග්‍රෑම් 11,000 හෝ ඊට වැඩි<br>උපරිම බර පැටවීම: කිලෝග්‍රෑම් 6,500 හෝ ඊට වැඩි | |
| අධි ධාරිත යතුරුපැදි | නියමිත මගී ධාරිතාව: මගීන් 2 දෙනෙකු දක්වා<br>එන්ජින් විස්ථාපනය:<br>400 cc ට වැඩි, හෝ 20 kW ට වැඩි බල ප්‍රතිදානය | ★ සාමාන්‍ය රීතියක් ලෙස, තමා බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසු වසරක් (අධිවේගී මාර්ගවල වසර තුනක්) යතුරුපැදියක දෙදෙනෙකු ගමන් කළ නොහැක. |
| සාමාන්‍ය යතුරුපැදි | නියමිත මගී ධාරිතාව: මගීන් 2 දෙනෙකු දක්වා<br>එන්ජින් විස්ථාපනය:<br>400 cc හෝ ඊට අඩු, හෝ 20 kW හෝ ඊට අඩු බල ප්‍රතිදානය | |
| ඇදගෙන යාම | දළ වාහන බර කිලෝග්‍රෑම් 750 ඉක්මවන ට්‍රේලර් | |











### ★බස් රථ සහ කුලී රථ පැදවීම

- බස් රථයක් හෝ කුලී රථයක් පැදවීම බස් රථයක් හෝ කුලී රථයක් පැදවීම (ගාස්තු අය කර මගීන් ප්‍රවාහනය කිරීම) සඳහා, වෙනම "2 වන පන්ති රියදුරු බලපත්‍රය" ක් අවශ්‍ය වේ.
- තමා ධාවනය කරන මෝටර් රථ වර්ගය අනුව තමාට "2 වන පන්ති රියදුරු බලපත්‍රය" ක් තිබීම අවශ්‍ය වනු ඇත.
- එසේම, වෘතියක් ලෙස තමා මගීන් ප්‍රවාහනය කරන්නේ නම්, තම 2 වන පන්ති රියදුරු බලපත්‍රයට අමතරව, රථවාහන ප්‍රවාහන කාර්යාංශ වැනි බලධාරී අනුමැතිය ද ලබා ගැනීම අවශ්‍ය වේ.




## (10) රැගෙන යා හැකි භාණ්ඩ බර ප්‍රමාණය සහ පැටවීමේ ක්‍රමය පරීක්ෂා කරමු




**★අවසරය අවශ්‍යයි★**

**ඉදිරිපස / පසුපස**
පැටවුම වාහනයේ ඉදිරිපස හෝ පසුපස වාහනයේ දිගට වඩා දහයෙන් එකකට වඩා ඔබ්බට විහිදෙන විට

**වම / දකුණ**
පැටවුම වාහනයේ යම් පසක් වාහනයේ පළලින් දහයෙන් එකකට වඩා ඔබ්බට විහිදෙන විට

**දිග**
පැටවුම වාහනයේ උසට වඩා මෙම උස දහයෙන් දෙකක් ඉක්මවන විට

**පළල**
පැටවුම වාහනයේ පලල ඒම පළලින් දහයෙන් දෙකක් ඉක්මවන විට

**උස**
වාහනයේ පැටවුම් වේදිකාවේ උස මීටර් 3.8 (සැහැල්ලු මෝටර් වාහන සහ ත්‍රිරෝද රථ සඳහා මීටර් 2.5) සිට අඩු කිරීමෙන් ලබාගත් උසට වඩා පැටවුමෙහි උස ඉක්මවන විට

★ ට්‍රක් රථයකට භාණ්ඩ පැටවීමකදී, එම බර එහි ප්‍රමාණය සහ එය පටවන ආකාරය පිළිබඳ සීමාවන් තිබේ.

★ නිසා, පැටවුම් භාණ්ඩයේ බර, ප්‍රමාණය හෝ පැටවීමේ ක්‍රමයේ සීමාවන් ඉක්මවා ගියහොත්, එවැනි සීමාව ඉක්මවා යන බරක් සහිතව වාහනය පදවන පුද්ගලයා පිටවීමේ ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති පොලිස් ස්ථානයේ ප්‍රධානියාගෙන් අවසර ලබා ගත යුතුය.



**රථවාහන නීති උල්ලංඝනය කිරීම් සහ රථවාහන අනතුරු සඳහා දණ්ඩනයන් නියම කෙරේ.**

福 岡 県 警 察
Fukuoka Prefectural Police